සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය
சமூகவலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE

# දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
# வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
# Department of Divineguma Development

4වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
4வதுமாடி,செத்சிறிபாய பத்தரமுல்ல
4th floor, **Sethsiripaya ,Battaramulla**

මගේ අංකය / எனதுஇல / My No: DDD/HO/16/BSM/ Bank Grading

ඔබේ අංකය / உமது இல / Your No: ........................................

දිනය / திகதி / Date: 2017/01/16

දිස්ත්‍රික් ලේකම්/ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ,
........................................................

**<u>දිළිඳුකම අවම කිරීම උදෙසා ක්‍රියාත්මක වන දිවිනැගුම ප්‍රජාමූල බැංකු ඵලදායි හා කාර්යක්ෂමතාවය මත ශ්‍රේණිගත කිරීම (එතැන් හා දුරස්ත පරීක්ෂාවන් අනුව)</u>**

අධීක්ෂණ හා මෙහෙයුම් අංශය විසින් දිස්ත්‍රික් අධීක්ෂණ ඒකක හරහා මේ සමඟ අමුණා ඇති උපදෙස් මාලාවේ සඳහන් නිර්ණායක අනුව 2016/12/31 දිනට බැංකු ශ්‍රේණිගත කිරීම් සිදුකල යුතුව ඇත. 2016/11/28 දින ප්‍රගති සමාලෝචනයේදී අනාවරණය වූ පරිදි ඔබ ක්ෂේත්‍ර කටයුතු සිදු කරමින් එතැන් පරීක්ෂණයක් සිදුකර ඇති බැවින්, එම තොරතුරුත් වර්තමානයේ පවතින ක්ෂේත්‍රයේ තත්ත්වයත් පදනම් කර ගනිමින් දිවිනැගුම ප්‍රජාමූල බැංකු මේ සමඟ ලබා දී ඇති උපදෙස් මත ආකෘති අංක 01 අනුව ශ්‍රේණිගත කිරීම සිදුකර, බැංකු පෙළගැස්වීම සිදු කරන ලෙස දිස්ත්‍රික් අධීක්ෂණ ඒකක කළමනාකරු /නිලධාරින් වෙත දැනුම් දෙන මෙන් කාරුණිකව ඉල්ලමි.

02. 2016/12/31 දිනට තොරතුරු පදනම් කරගෙන බැංකු අධික්ෂණ හා මෙහෙයුම් අංශයේ ශ්‍රේණිගත කිරීම සිදු කල යුතුවේ. **දිස්ත්‍රික් මට්ටමින් මෙම ශ්‍රේණිගත කිරීම දිස්ත්‍රික් ඒකක භාර කළමනාකරුගේ වගකීමක් වන අතර, මෙම ශ්‍රේණිගත කිරීමේදී තොරතුරු සම්පූර්ණ කිරීමට දිවිනැගුම ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති කළමනාකරුවන් වෙත ලබා නොදිය යුතුය.** අධීක්ෂණ කළමනාකරුවන් හා අධීක්ෂණ නිලධාරින්ට ලබා දී ඇති උපදෙස් පරිදි බැංකුවේ සියලුම කටයුතු පරීක්ෂා කර බලා මෙම ශ්‍රේණිගත කිරීම සිදු කල යුතුවේ.

03. අංශ කිහිපයක් හරහා සිදුකරනු ලබන බැංකු ශ්‍රේණිගත කිරීම පදනම්කර ගනිමින් විශේෂ කමිටුවක් මඟින් ප්‍රධාන කාර්යාලය විසින් 2017 වර්ෂයේ **පෙබරවාරි මස පලවන සතියේදී බැංකු වර්ගීකරණය සිදු කිරීමටත්,** ඒ අනුව **බැංකු උපහාර වැඩසටහනක් මාර්තු මස සිදු කිරිමටත් අපේක්ෂිත බැවින්,** ඉතා කඩිනමින් නිවැරදිව තොරතුරු එවිය යුතු වේ. එබැවින්, දිස්ත්‍රික් මට්ටමින් මෙම ශ්‍රේණිගත කිරීමේ කාර්යය සඳහා ප්‍රමුඛතාවය ලබා දිය යුතුය.

04. ඔබ දිස්ත්‍රික්කයේ සියලුම බැංකු ශ්‍රේණිගත කර ප්‍රධාන නිර්ණායක 04 සම්බන්ධව එක් එක් බැංකුවට අදාල රූපරාමු (පින්තූර) ඇතුලත් සංයුක්ත තැටියක් (CD) එවිය යුතු අතර, එය බැංකු ශ්‍රේණිගත කරනු ලබන විශේෂ කමිටුවේ අවධානයට ලබා දිය යුතු වේ. **පරිගණකයට දත්ත ඇතුළත් කිරීම සඳහා සිංහල මාධ්‍ය සඳහා ඉස්කෝල පොත (Iskoola pota Font) ද දමිළ මාධ්‍ය සඳහා කලහම් (Kalaham Font) ද භාවිතා කරන්න.** මෙම රාජකාරිය විශේෂ අවධානයකින් යුතුව ඉතා සැලකිලිමත්ව සිදුකල යුතු බව තවදුරටත් සඳහන් කරමි. ලබා දී ඇති උපදෙස් අනුව සියලු තොරතුරුත් සමඟ සංයුක්ත තැටිය (CD) 2017 ජනවාරි 30 දිනට පෙර බැංකු අධික්ෂණ හා මෙහෙයුම් අංශයට රැගෙනවිත් භාරදිය යුතු බව තවදුරටත් කාරුණිකව සඳහන් කරමි.

නීල් බණ්ඩාර හපුහින්න,
අධ්‍යක්ෂ ජනරාල්

| අධ්‍යක්ෂ ජනරාල් | අතිරේක අධ්‍යක්ෂජනරාල් | අධ්‍යක්ෂ (පාලන) | ප්‍රධාන ගණකාධිකාරී | කාර්යාලය |
|---|---|---|---|---|
| பணிப்பாளர் தலைமையதிபதி | மேலதிகபணிப்பாளர்தலைமையதிபதி | பணிப்பாளர்(நிர்வாகம்) | பிரதான கணக்காளர் | அலுவலகம் |
| Director General | Additional Director General | Director (Administration) | Chief Accountant | Office |
| Tel:011-2873802/2872202 | 011-2871672 | 011-2873799 | 011-2869742 | 011-2887280 |
| Fax -011-2889002 | 011-2871672 | 011-2873996 | 011-2869742 | **011- 2887722(Hotline)** |
| dg@divineguma.gov.lk | adg@divineguma.gov.lk | diradmin@divineguma.gov.lk | finance@divineguma.gov.lk | |